[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 14. 75 තැපැල් ගාස්තුව : රු.5.25

# 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත

[සහතිකය සටහන් කළේ ඔක්තෝබර් මස 07 වැනි දින.]

එල්.ඩී. - ඕ. 34/98.

**ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ධීවර කරමාන්තයෙහි යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන තැනැත්තන්ගේ තාක්ෂණික සහ කළමනාකරණ දක්ෂතා දියුණු කිරීමේ කාර්ය සඳහා ආයතනයක් පිහිටුවීම අවශ්‍ය හෙයින් ද: පූර්විකාව.

මෙහි මින් මතු පිහිටුවනු ලබන ආයතනය ජාතික වැදගත්කමක් ඇති ආයතනයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :

**1.** මේ පනත 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.

1 වන කොටස

## ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පිහිටුවීම

**2.** (1) ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනුලබන) ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පිහිටුවීම.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට වෙන් කර දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එම නාමයෙන් එය විසින් සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** ආයතනයේ කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතු ය. ආයතනයේ කර්තව්‍ය.

(අ) ධීවර කර්මාන්තයේ යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන තැනැත්තන්ගේ තාක්ෂණික සහ කළමනාකරණ

දක්ෂතා දියුණු කිරීමේ පරමාර්ථයෙන් ධීවර හා නාවික ඉංජිනේරු ශිල්පයේ අධ්‍යාපන පාඨමාලා සහ පුහුණු වැඩ සටහන් සකස් කිරීම ;

(ආ) සහතික, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය සඳහා ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පයේ අධ්‍යාපන පාඨමාලා හා පුහුණු වැඩ සටහන් සැපයීම ;

(ඇ) ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල ආධාරය ඇතිව ධීවර සහ නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ගැන සාකච්ඡා, සම්මන්ත්‍රණ, සමූහ සාකච්ඡා පැවැත්වීම සහ පැවැත්වීමට වැඩ පිළිවෙලවල් යෙදීම ;

(ඈ) ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පයේ අධ්‍යාපනය සහ ව්‍යාප්ති පුහුණුව සම්බන්ධයෙන් පර්යේෂණ, සමීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම හෝ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශවල ආයතනය සමග ගුරුවරුන් සහ ශිෂ්‍යයන් හුවමාරු කිරීම හෝ වෙනත් ක්‍රම මගින් සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඊ) උපදෙස් සඳහා අමාත්‍යවරයා විසින් සභාවට යොමු කරන ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පයට අදාළ සියලු කාරණා ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම.

ආයතනයේ බලතල.

4. ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි බලතල ආයතනයට තිබිය යුතු අතර ආයතනය විසින් විශේෂයෙන් පහත දැක්වෙන කාර්ය කළ හැකි -

(අ) ආයතනයේ කාර්ය සඳහා මධ්‍යස්ථාන, පුස්තකාල සහ විද්‍යාගාර සහ වෙනත් පහසුකම් ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම ;

(ආ) ආයතනයේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන වෙනත් ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීතාව සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඈ) ආයතනය විසින් තෝරාගනු ලබන අභ්‍යාසලාභීන්ට අදාළ ක්ෂේත්‍රවල පුහුණුව ලබා දීම සඳහා සේවා යෝජකයන් සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඇ) ආයතනයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි යොදවා ගැනීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයෙන් පහකිරීම ;

(ඉ) ආයතනය විසින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩ සටහන් සඳහා ගාස්තු හෝ වෙනත් යම් ගෙවීම් අය කිරීම ;

(ඊ) යම් දේපළක් අත්කර ගැනීම, දැරීම හෝ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම ; එසේ වුවද අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව, ආයතනයේ කිසිම නිශ්චල දේපළක් බැහැර නොකළ යුතු ය ;

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන, ත්‍යාග හෝ ආධාර ලබාගැනීම ;

(එ) ආයතනයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සුදුසු යයි සභාව අදහස් කරන ආකාරයකින් ආයෝජනය කිරීම හෝ එවැනි යම් අරමුදල් බැංකුවක යම් ස්ථිර තැන්පතුවක තැන්පත් කිරීම ;

(ඒ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රම හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම සහ එවැනි යම් යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම ;

(ඔ) ආයතනයේ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය සභාවේ සාමාජිකයන්ට හෝ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ආයතනයේ යම් නිලධරයකුට පැවරීම ;

(ඕ) යම් උපදේශක කර්තව්‍ය භාරගැනීම ;

(ක) ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පය පිළිබඳ අවශ්‍ය පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම ;

(ග) එම පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා වූ විෂයමාලා සමාලෝචනය කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ;

(ච) ධීවර සහ නාවික ඉංජිනේරු ශිල්පය පිළිබඳ අධ්‍යාපනික දේ පළකිරීම ;

(ජ) එම අධ්‍යයන පාඨමාලාවට සහ පුහුණු වැඩසටහන් වලට ඇතුළත් කර ගැනීම සඳහා කොන්දේසි සහ කාර්ය පටිපාටිය දැක්වෙන රීති සෑදීම ;

(ට) එවැනි අධ්‍යයන පාඨමාලා වලින් සහ පුහුණු වැඩසටහන් වලින් ආවරණය වූ ක්ෂේත්‍රවල ප්‍රවීණතාවයක් ලබා ඇති තැනැත්තන් තීරණය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම ;

(ඩ) එම අධ්‍යයන පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් හදාරා අදාළ විභාග සමත් වූ අයට ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම ;

(ණ) ආයතනයේ ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව, සම්මාන, මුදල් ආධාර, පදක්කම් සහ තෑගි ප්‍රදානය කිරීම ;

(ත) ආයතනයේ ශිෂ්‍යයන්ගේ, ගුරුවරුන්ගේ, නිලධරයන්ගේ සහ සේවකයන්ගේ විනය විධිමත් කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ද) එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික සියලු ක්‍රියා හෝ දේ කිරීම.

ආයතනයේ පරිපාලනය සභාවට පැවරෙන බව.

5. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ පාලක සභාවට පැවරිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා මේ පනත මගින් ආයතනයට පවරා හෝ නියම කර හෝ වෙන් කර දී ඇති බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම ආයතනය විසින් කළ හැකි ය.

**6**. (1) සභාව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය :- සභාවේ සංයුතිය.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම්

(i) ධීවර කටයුතු සහ ජලජ සම්පත් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iii) මුදල් සහ ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iv) නාවික කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(v) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන පනත මගින් පිහිටුවන ලද ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ සභාපති ;

(vi) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙක් ;

(vii) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා.

*(ආ)* ධීවර ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද හෝ සුදුසුකම් හෝ හැකියාව පෙන්නා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් අටදෙනෙකුට නොවැඩි ගණනක්.

(2) සභාවේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු සභාවේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

(3) පර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ ධුරය දැරීමට නුසුදුස්සකු විය යුතු ය.

(4) අසනීපවීම, දුබලතාවය හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා පත් කළ සාමාජිකයකුට ඔහුගේ ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන වෙනත් තැනැත්තකු ඔහු වෙනුවට පත් කළ හැකි ය.

(5) නිවාඩු ලබා නොගෙන සභාවෙහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණ සිටින යම් පත් කළ සාමාජිකයකු එම රැස්වීම් වලින් අවසාන රැස්වීමේ දිනයේ සිට ධුරය අත්හරිනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

නිලධරයන්ගේ ධුර කාලය.

7. (1) සභාවේ සාමාජිකයකු 6 වන වගන්තියේ (2) සහ (3) සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ඒ පිළිබඳ හේතු දක්වා සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයාට යොමු කරනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මරණය, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ වෙනත් හේතුවක් නිසා යම් පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පුරප්පාඩුවක් ඇතිවුවහොත් 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) පත් කළ සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ වෙනත් ක්‍රමයක් නිසා ඇති වූ පුරප්පාඩුවක් පිරවීමට වෙනත් තැනැත්තකු පත් කරන ලද අවස්ථාවක, එසේ පත් කරන ලද තැනැත්තා ඔහු අනුප්‍රාප්තවන සභාවේ සාමාජිකයාගේ ධුර කාලයේ නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

8. (1) සභාවේ සභාපතිවරයා විසින් අමාත්‍යවරයාට යොමු කරන ලද ලිපියක් මගින් සභාපති ධූරයෙන් කවර හෝ අවස්ථාවක ඉල්ලා අස්විය හැකි ය. සභාවේ සභාපතිවරයා.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක ඒ පිළිබඳ හේතු දක්වා සභාපතිවරයා සභාපති ධූරයෙන් ඉවත් කළ හැකි ය.

(3) අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයා ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සභාවේ තවත් වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(4) (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිගේ ධූර කාලය සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ ධූර කාලය විය යුතු ය.

9. ආයතනයේ මුද්‍රාව :- ආයතනයේ මුද්‍රාව.

(අ) සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය ;

(ආ) සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කළ හැකි ය ;

(ඇ) සභාවේ අනුමතය ඇතිව ද සභාපති සහ සභාවේ සාමාජිකයකු හෝ සභාපති සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර යම් ලේඛනයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ ලේඛනයේ තම නම් අත්සන් කළ යුතු ය.

10. (1) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් පත් කරනු ලබන සාමාජිකයකු සභාවේ යම් රැස්වීමක මූලාසනය දැරිය යුතු ය. සභාවේ රැස්වීම්.

(2) සභාවේ රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව සභාවේ සාමාජිකයන් පස් දෙනෙක් විය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයා හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයා විසින්, තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් පාවිච්චි කළ යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සභාව විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**11.** මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ අනුව සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

ශාස්ත්‍රීය මණ්ඩලය.

**12.** ආයතනයේ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශාස්ත්‍රීය මණ්ඩලයක් තිබිය යුතු අතර ඒ මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) ආයතනයේ සභාපතිවරයා ;

(ii) ආයතනයේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා ;

(iii) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා ;

(iv) 1998 අංක 53 දරන ජාතික ජලජ ජීවී වගා සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද ජාතික ජලජ ජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා ;

(v) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා ;

(vi) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(vii) මොරටුව විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(viii) කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ix) රුහුණු විශ්ව විද්‍යාලයේ මත්ස්‍ය ජීවවිද්‍යා අංශයේ අංශ ප්‍රධානියා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(x) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන පනතින් පිහිටුවන ලද ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා ;

(xi) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(xii) මහපොළ අභ්‍යාස ආයතනයේ නියෝජිතයෙක් ;

(xiii) ආයතනයේ ශාස්ත්‍රීය දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්.

**13**. (1) මණ්ඩලය සභාවට වගකිව යුතු අතර පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම එය විසින් කළ යුතු ය :- මණ්ඩලයේ බලතල.

(අ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනයේ කටයුතු වලට අදාළ විය හැකි කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම ;

(ආ) ආයතනයේ රීතිවලට අනුකූලව විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සමර්ථ වන්නා වූ ද ආයතනය විසින් නියම කරනු ලබන වෙනත් කොන්දේසි ඉටුකර ඇත්තා වූ ද ආයතනයේ ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසු වන තැනැත්තන් සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඇ) සභාව විසින් එය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් ගැන සලකාබලා වාර්තා කිරීම ;

(ඈ) ආයතනයේ පාඨමාලා, පුහුණුවීමේ වැඩසටහන් හා පවත්වනු ලබන විභාග හා සම්බන්ධ සියලු කාරණා මත නිර්දේශ හා වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඉ) අධ්‍යයන පාඨමාලාවලට හෝ පුහුණුවීමේ වැඩසටහන් වලට ඇතුළත්වීම සඳහා සහ ආයතනය විසින් පවත්වනු ලබන විභාග සඳහා පනවනු ලැබිය යුතු නියමයන් සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඊ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා වලට, පුහුණුවීමේ වැඩසටහන් වලට හා විභාගවලට අදාළ වන රීති සෑදීම ;

(උ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී පරීක්ෂකවරයන් ලෙස පත්කිරීම සඳහා යෝග්‍ය තැනැත්තන්ගේ නම් සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඌ) ආයතනයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය පත් කිරීමට, ඔවුන්ගේ වැටුප්, පාරිශ්‍රමික, දීමනා හා ගාස්තුවලට, ඔවුන්ගේ විනය පාලනයට, ඔවුන් සේවයෙන් පහකිරීම හා විශ්‍රාම ගැන්වීමට සහ ඔවුන්ගේ වැඩ කරන වේලාවල්, නිවාඩු දිනයන් හා නිවාඩුවලට අදාළ වූ රීති, බඳවාගැනීමේ ක්‍රමය සහ කාර්ය පරිපාටිය සභාව වෙත නිර්දේශ කිරීම ;

(එ) ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව, සම්මාන, මුදල් ආධාර, පදක්කම් හා ත්‍යාග ප්‍රදානය කිරීමට අදාළ විය යුතු කොන්දේසි සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඒ) ශිෂ්‍යත්ව, සම්මාන, මුදල් ආධාර, පදක්කම්, ප්‍රදාන සහ ත්‍යාග සඳහා සභාව විසින් අනුමත කර ඇති කොන්දේසි සපුරා ඇති තැනැත්තන් සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඔ) සභාවේ අනුමතය ඇතිව, මණ්ඩලයේ නියෝජිතයන්ගෙන් සංයුක්ත වූ කමිටු පත් කිරීම ; සහ

(ඕ) මණ්ඩලයේ හා මණ්ඩලයේ කමිටුවල රැස්වීම්වලට අදාළ වන සහ රැස්වීම්වල කාර්ය පරිපාටිය විධිමත් කිරීම සඳහා රීති සෑදීම.

(2) තත් කාරණය සම්බන්ධයෙන් වූ බලතල හෝ කර්තව්‍ය පවරා දෙනු ලැබූ සභාව හෝ යම් නිලධරයකු විසින්, මණ්ඩලයේ නිර්දේශය ලබා නොගෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම්

ශාස්ත්‍රීය කාරණයක් මත කිසිදු තීරණයක් නොගත යුතු ය. සභාවේ හෝ ඒ නිලධරයාගේ තීරණය මණ්ඩලයේ නිර්දේශයට පටහැනි වන අවස්ථාවක, මණ්ඩලයේ නිර්දේශය පිළිනොගැනීම සඳහා වන හේතු, සභාව හෝ ඒ නිලධරයා විසින් දක්වා සිටිය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, නිර්දේශයක් හෝ වාර්තාවක් බලරහිත කරනු නොලැබිය යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ආයතනයේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

14. (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා විය යුතු (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ - ජනරාල්වරයකු, සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතු ය. ආයතනයේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ- ජනරාල්වරයා මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, සේවයෙන් විශ්‍රාමයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කරතහොත් මිස, පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) ආයතනයේ කටයුතු පරිපාලනය හා ආයතනයේ කාර්ය මණ්ඩලයේ පාලනය සභාවේ සාමාන්‍ය විධානයට යටත්ව, අධ්‍යක්ෂ- ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය. සභාවේ සියලුම තීරණ, ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත සභාව විසින් පවරා දෙනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය ඉටුකිරීම ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(5) තත් කාර්ය සඳහා සභාව විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂ- ජනරාල්වරයා -

(අ) ස්වකීය කාර්ය ඉටුකිරීමට නොහැකි තත්ත්වයකට ස්ථිර වශයෙන් ම පත්වුවහොත් ; හෝ

(ආ) සභාවේ මතය අනුව වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ හෝ ආයතනයේ පරමාර්ථවලට පැහැදිලිව ම ප්‍රතිවිරුද්ධ යම් ක්‍රියාවක් හෝ දෙයක් කළහොත් ; හෝ

(ඇ) සභාවේ තීරණ ක්‍රියාවේ යෙදවීම හිතාමතා ම පැහැර හැරියහොත් ;

අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ- ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ- ජනරාල් ධුරය, ඒ ධුරය දරන්නා මියගිය විට, (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ අමාත්‍යවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වූ විට හෝ හිස් විය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, අධ්‍යක්ෂ -ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු අධ්‍යක්ෂ- ජනරාල්වරයා වශයෙන් නැවත පත් කරනු ලැබීමට සුදුසුස්සකු විය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**15**. මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනයේ නිලධරයන් හා සේවකයන් පත්කිරීමට සභාවට බලතල ඇත්තේ ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා ආයතනයට කරනු ලබන සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**16**. යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු, ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට කරන ලද යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කරලීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය නිලධරයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**17**. (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින්, එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික ධීවර පුහුණු ආයතනයේ රාජ්‍ය නිලධරයන් විසින් දැන්වීම් දිය යුතු බව.

**18**. (අ) රජයේ ස්ථාන මාරුවීම් සහිත සේවයක නිලධරයකු නොවන්නා වූ ද යම් රාජ්‍ය නිලධරයකු වන ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (මේ කොටසෙහි "ජා.ධී.පු.ආ." යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ධීවර පුහුණු ආයතනයේ සෑම රාජ්‍ය නිලධරයෙකු විසින් ම, මේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ දිනයෙන් පසු එහෙත් නියමිත දිනයට කලින්, නියමිත දිනයේ දී -

(i) ජා.ධී.පු.ආ. හි විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටුකර තිබේ නම්, රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගෙන ආයතනයේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(ii) ජා.ධී.පු.ආ. හි විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටුකර තිබේ නම්, රජයේ සේවයෙන් අස්වී, ආයතනයේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(iii) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකු වේ නම්, රජයේ සේවයෙන් අස්වී, ආයතනයේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(iv) රජයේ සේවයෙන් විශ්‍රාම ලබාගෙන හෝ අස්වී, ආයතනයේ සේවා නියුක්තයකු නොවීමට,

ඔහු අදහස් කරන බව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියවිල්ලකින් නිවේදනයක් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ නියමිත දිනයට පෙර ධීවර සහ ජලජ- සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත ජා.ධී.පු.ආ. හි රාජ්‍ය නිලධරයකු විසින් දෙන ලද නිවේදනයක් අවසානාත්මක වන්නේ ය.

18 වන වගන්තියේ යටතේ නිවේදනයක් නොදීමේ ප්‍රථිඵලය.

**19**. 18 වන වගන්තියේ (අ) ඡේදයේ (i), (ii),(iii) හෝ (iv) වන අනුඡේද යටතේ දිය යුතු නිවේදනය නියමිත දිනයට පෙර නොදෙන ජා.ධී.පු.ආ. හි යම් රාජ්‍ය නිලධරයකු එම දිනයේ දී සහ ඉන් පසු රාජ්‍ය නිලධරයකු ලෙස දිගටම සිටීම අවසන් කරන්නේ ය.

18 වන වගන්තියේ යටතේ නිවේදනයක් දීමේ ප්‍රතිඵලය.

**20**. (1) 18 වන වගන්තියේ (අ) ඡේදයේ (i) හෝ (ii) හෝ (iii)හෝ (iv) වන අනුඡේදය යටතේ නියමිත දිනයට පෙර නිවේදනයක් දෙන ජා.ධී.පු.ආ හි යම් රාජ්‍ය නිලධරයෙක් -

(අ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (i)වන අනුඡේදය යටතේ නම්, නියමිත දිනයේ සිට ආයතනයේ සේවා නියුක්තයකු වන අතර, ඒ දිනයේ දී ඔහු රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලබන්නේ ය. තව ද, ඒ දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප ද ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය ; නැතහොත්

(ආ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ නම්, නියමිත දිනයේ සිට ආයතනයේ සේවා නියුක්තයකු වන අතර ඒ දිනයේ දී ඔහු රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලබන්නේ ය.

තවද, ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන දීමනාව ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය ; නැතහොත්

(ඇ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ නම්, නියමිත දිනයේ සිට ආයතනයේ සේවා නියුක්තයකු වන අතර, සේවයෙන් පහකිරීමේ හේතුවෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්යය සඳහා සළකනු ලැබිය යුතු ය ;නැතහොත්

(ඇ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ නම්, සහ -

(i) ඔහු ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රාජ්‍ය නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප ම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

(ii) ඔහු ඒ ඡේදයේ (ii)වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රාජ්‍ය නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් අස් වූ ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලබන දීමනාව ම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය ; නැතහොත්

(iii) ඔහු ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රාජ්‍ය නිලධරයකු නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ කාර්ය සඳහා සේවයෙන් පහකිරීමේ හේතුව මත නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු නියමිත දිනයේ දී ආණ්ඩුවේ සේවයෙන් අස් වූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සහ මේ පනතේ වෙනත් යම් විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විටක, ඒ ගැටුමේ හෝ අනනුකූලතාවේ ප්‍රමාණයට ඒ උපවගන්තිවල විධිවිධාන ඒ වෙනත් විධිවිධාන අභිබවා බලපවත්වන්නේ ය.

ආයතනයේ ඇතැම් නිලධරයන්ට අදාළ විශේෂ විධිවිධාන.

**21**. 20 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ හේතුවෙන් නියමිත දිනයේ දී ආයතනයේ සේවා නියුක්තයකු බවට පත්වන ආයතනයේ සේවකයකුට ඒ සේවකයකු සම්බන්ධයෙන් මෙහි පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :-

(අ) ඒ සේවා නියුක්තයා, ආයතනය සහ සේවා නියුක්තයා අතර එකඟවනු ලබන යම් නියමයක් හා කොන්දේසි මත ආයතනය විසින් සේවයේ යෙදවිය යුතු ය ;

එසේ වුව ද ඒ නියමයන් හා කොන්දේසි, ඒ සේවා නියුක්තයා ජාතික ධීවර පුහුණු ආයතනයේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටියේ යම් නියමයන් හා කොන්දේසි මත ද, ඊට වඩා අඩු වාසිදායක නොවිය යුතු ය ;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම දිනයේ දී ඒ සේවා නියුක්තයා ජාතික ධීවර පුහුණු ආයතනයේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශය පත් කරන ලද තනතුරක් දැරූ රජයේ නිලධරයකුව සිටියේ නම්, සහ ඔහුට අවුරුදු දහයකට අඩු, එහෙත් අවුරුදු අටකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් තිබුණේ නම් -

(i) ඔහු ආණ්ඩුව යටතේ සේවය කර තිබෙන කාලසීමාවට යම් කාලයක් එකතු කළ විට, එම සේවා කාලයන්හි එකතුව (ජාතික ධීවර පුහුණු ආයතනය යටතේ සේවය එම එකතුව ආගණනය කිරීම සඳහා ආණ්ඩුව යටතේ සේවයක් ලෙස ගණන් ගැනීමේ දී) අවුරුදු දහයක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් බවට පත් වන්නේ ද, ඒ කාලසීමාව තුළ ඔහු ජාතික ධීවර පුහුණු ආයතනයේ, නියමිත දිනයට පෙරාතුව ම දිනයේ දී, දැරූ තනතුර තවදුරටත් දරනු ලබන ලෙස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සළකනු ලැබිය යුතු ය.

(ii) ඔහු ජාතික ධීවර පුහුණු ආයතනයේ නියමිත දිනයට පෙරාතුව ම දිනයේ දී දැරූ තනතුර තවදුරටත් දරන ලෙස, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සළකනු ලබන කාලසීමාවේ සෑම සම්පූර්ණ මාසයක් සඳහා ම, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා, ඔහු වෙනුවෙන් ආයතනය විසින් ආයතනයේ අරමුදලින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(iii) එම කාලසීමාව අවසානයේ දී ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලද සේ සැළකිය යුතු අතර, එම කාලසීමාව අවසානයේ දී ඔහු තනතුර අහෝසි කිරීමේ හේතුව මත විශ්‍රාම ලැබුවේ නම් ඔහුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුප සඳහා ඔහු සුදුස්සකු වන්නේ ය.

## III වන කොටස

### මුදල්

ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය.

**22**. (1) ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය, ධීවර විෂය භාර අමාත්‍යවරයාගේ වැය ශීර්ෂය යටතේ භාණ්ඩාගාරය විසින් වෙන් කර දෙනු ලැබිය හැකි සහ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් ප්‍රදානය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් වන්නේ ය.

(2) විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් හෝ අවසර දෙනු ලැබෙන යම් මුදල් ප්‍රමානයන්ගෙන්, ආයතනයේ ප්‍රාග්ධනය වැඩි කරනු ලැබිය හැකි ය.

ආයතනයේ අරමුදල.

**23**. (1) ආයතනයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට පහත සඳහන් මුදල් බැර කරනු ලැබිය යුතු ය -

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී, ආයතනය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු මුදල් හා ආයතනය විසින් ඉටු කිරීමේ දී ආයතනය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඈ) මේ පනත මගින් හෝ යටතේ ඒ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල්.

(3) (අ) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, ; සහ

(ආ) අරමුදලින් ගෙවිය යුතු බවට මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ නියමිත සියලු මුදල්

ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

**24**. ලිත් වර්ෂය, ආයතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

ගිණුම්, විගණනය.

**25**. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

අමාත්‍යවරයාගේ විධාන.

**26**. (1) සභාව විසින් සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සම්බන්ධයෙන්, ප්‍රතිපත්තිමය කරුණුවලට අදාළ වන තාක් දුරට, අමාත්‍යවරයා විසින් සභාවට යම් පොදු හෝ විශේෂ විධාන ලියවිල්ලක් මගින් කරනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) ආයතනයේ ක්‍රියාකාරකම් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට වාර්තා

කල යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සියලු පහසුකම්, සභාව විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) සභාව විසින්, තුන් අවුරුදු වැඩ සැලැස්මක්, වාර්ෂික සැලැස්මක් සහ ආයතනය සඳහා වැඩ සටහනක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ සහ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**27**. 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තිය අධ්‍යාපන පනතේ විධිවිධාන සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 128 වගන්තියේ විධිවිධාන ආයතනයට සහ ආයතනය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ආයතනය සඳහා, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම.

**28**. (1) ආයතනයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද, ඒ දේපළ ඒ කාර්යය සඳහා යෝජිත අත්පත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත් කර ගෙන, ආයතනය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) ආයතනය සඳහා, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගන්නා යම් නිශ්චල දේපළක් සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල යන දෙයාකාරයේම රජයේ දේපළ ආයතනයට ලබාදිය යුතු බව.

**29**. ආයතනයේ කාර්ය සඳහා ආයතනයට අවශ්‍ය වන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් චංචල හෝ නිශ්චල දේපළක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ආයතනය වෙත පවරා දෙනු ලැබිය හැකි අතර, එසේ පවරා දෙනු ලැබූ යම් දේපළක්, ඒ නියමයේ දින සිට ආයතනය සතුව ආයතනයේ දේපළක් බවට පත් වන්නේ ය.

ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලබන බව.

**30**. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ කථනය කරනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන් සහ ආයතනයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**31**. සභාවේ සියලු සාමාජිකයන් සහ ආයතනයේ නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**32**. (1) මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව :-

(අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවේ ඒ සාමාජිකයාට හෝ ආයතනයේ නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව ;

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ ගෙන එනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවක් බවට අධිකරණය තීරණය කළහොත්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලද බවට උද්දේශිත යම්

ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම්අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නෙත් නම්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගනු ලැබී නම් මිස, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**33**. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද :- ශේෂ කිරීම්.

(අ) ජාතික ධීවර පුහුණු ආයතනය සඳහා සහ වෙනුවෙන් යම් අභ්‍යාසලාභියකු සමග ආණ්ඩුව ඇතුළත් වී ඇත්තා වූ ද නියමිත දිනයට පොරාතුව ම දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, සෑම පුහුණුවීමේ ගිවිසුමක් ම මේ පනත යටතේ ඒ අභ්‍යාසලාභියා සමග ආයතනය ඇතුළත් වී ඇති ගිවිසුමක් ලෙස, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි සලකනු ලැබිය යුතු ය

(ආ) ජාතික ධීවර පුහුණු ආයතනය විසින් සාදන ලද හෝ නියම කරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, සියලු රීති හෝ ප්‍රමිති ලෙස, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව සලකනු ලැබිය යුතු ය.

**34**. (1) නියෝග සෑදීම යුතු යයි මේ පනතින් නියමිත හෝ බලය දී ඇති නැතහොත් නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ නියෝගය යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**35**. (1) මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය

**36**. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ -

"ජාතික ධීවර පුහුණු ආයතනය" යන්නෙන් ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ධීවර පුහුණු ආයතනය අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.